
පුංචි
රෝසි
හසිනිකා ප්‍රභානි

# පුංචි රෝසි

**ආර්.කේ.ජී.එච් ප්‍රභානි රන්කැත්ත.**

**කතෘ**

**පළමු දිගහැරීම**

**මප/ කොත්/ ගාමිණී දිසානායක ජාතික පාසල**

**10 ශ්‍රේණිය**

**2025.02.08**

# පිදුම

මාගේ මැණියන්ට හා පියාණන්ටද, මාගේ
සහෝදරියට හා සහෝදරයාට ද,

මාගේ විද්‍යාලයේ ගරු
විද්‍යාලයාධිපතිතුමාට ද,

මාගේ විද්‍යාලයේ ගුරු මැණිවරුන්ටද,

ගුරු පියවරුන්ටද,

මාගේ මිතුරු මිතුරියන්ටද,

මෙම පොත කියවන ඔබටද,

මම මෙම පොත බැතිබරව පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලයෙ - මහනුවර

එදා දවස හරිම කළුවර දවසක්. මුලු අහසම අඳුරු වෙලා තිබුණේ, රාත්‍රී අහස වගේ. ටිකෙන් ටික මුළු පළාතම තවත් අඳුරු වෙන්න පටන් ගත්තා. වහින්න ඔන්න මෙන්න වගේ. “ක්‍රීස්.... ක්‍රීස්....” හැම පැත්තෙන්ම මේ ශබ්දය ඇහෙන්න පටන් ගත්තා. පුංචි රෝසි මහා කැලෑවක් මැද අතරමං වෙලා. එයාට මේ කැලෑවට එන්න සිද්ධ වුණේ, එයාගේ නපුරු කුඩම්මා එයාට දීපු දඬුවමක් නිසා.

රෝසි කියන්නේ පුංචි ගැහැණු ළමයෙක්. එයා බුද්ධිමත් වගේම කරුණාවන්ත කෙනෙක්. පුංචි රෝසිගේ අම්මා නැති වුණේ රෝසි ඉපදෙනකොටමයි. ඉතිං රෝසිගේ තාත්තා හැමදාම වැඩට යනවා. රෝසිව තනියම බලා ගන්නත් අමාරුයි. ඒ නිසා රෝසීගේ තාත්තා ආයෙත් විවාහ වෙන්න හිතුවා. කොහොම හරි රෝසිගේ තාත්තා ඉක්මනින්ම තවත් විවාහයක් කර ගත්තා. ඒ මැටිල්ඩා කියන නපුරු කාන්තාවත් සමග. නමුත් රෝසිගේ තාත්තා දැනගෙන හිටියේ නෑ මැටිල්ඩා කියන්නේ නපුරු ඒ වගේම ඊර්ෂ්‍යා කරන කෙනෙක් කියලා. මැටිල්ඩට හිටියා, ගැහැණු ළමයෙක් හා පිරිමි ළමයෙක්. ගැහැණු ළමයගෙ නම පෝලා. පිරිමි ළමයගේ නම පැට්‍රී. මේ දෙන්නම හරිම දඟකාරයි. පැට්‍රී, රෝසිට කැමති. එයා රෝසිට හරිම ආදරෙයි. ඒත් පෝලා රෝසිට සැලකුවේ වැඩකාරියෙක්ට වගේ. ඒ තරම්ම පෝලා රෝසිට වෛර කරනවා. රෝසි පෝලාට වඩා ගොඩක් ලස්සනයි. එනිසාමයි පෝලා රෝසිට අකමැති. රෝසි

නම් කවදාවත් පෝලා කරන වැඩවලට තරහා ගන්නේ නෑ. ඒත් රෝසිට හරිම දුකයි. මොකද රෝසිට හැම වෙලේම අම්මව මතක් වෙනවා.

දවසක් රෝසිට එයාගේ කුඩම්මා කිව්වා, වත්තේ තියෙන මල් පැළ වලට වතුර දාන්න කියලා. ඉතින් රෝසි, මල් බාල්දියත් අරගෙන මල් වලට වතුර දාන්න ගියා.



**රෝසි මල් බාල්දියක් අරගෙන වතුර දාන්න ගියා.**

ඒ වෙලාවේ පැටී, එයාගේ සෙල්ලම් බඩු එක්ක සෙල්ලම් කරමින් සිටියේ. ඉතින් රෝසි මේක දැක්කා. එයාටත් සෙල්ලම් බඩු එක්ක සෙල්ලම් කරන්න ගොඩක් ගොඩාක් ආස හිතුණ. මොකද රෝසිට කියලා එකම සෙල්ලම් බඩුවක්වත් තිබුණේ නෑ. ඉතින් එයාට මල් පැළවලට වතුර දාන එක අමතක වුණා. පැටී හරිම හොඳ ළමයෙක්. පැටී, රෝසි එක්ක සෙල්ලම් කරන්න කැමති වුණා. එහෙම ටික වෙලාවක් සෙල්ලම් කරනකොට කුඩම්මා රෝසිට කතා කළා, රෙදි ටික වේලෙන්න වැලට දාන්න කියල. ඒත් රෝසිට කුඩම්මා කතා කරනවා ඇහුනේ නෑ. ඉතින් කුඩම්මා රෝසිව හොයාගෙන ආවා. එතකොට කුඩම්මා මොකක්ද දැක්කේ...? පැටීගේ සෙල්ලම් බඩුත් එක්ක සෙල්ලම් කරනවා. ඉතිං කුඩම්මට හරියට කේන්ති ගියා. කුඩම්මා රෝසිට හොඳටම ගැහුවා. පැටී කිව්වා "අම්මේ, එයාව සෙල්ලම් කරන්න එක්ක ගත්තෙ මමයි" කියලා. කුඩම්මා ඒක ඇහුනේ නෑ වගේ තවත් හයියෙන් ගැහුවා. පුංචි රෝසිට හරිම දුකයි. එයා අඬන්න පටන් ගත්තා. එයාට හිතුණා එයාගේ අම්මා හිටියනම් කියලා.

රෝසී අඬලා අඬලා කම්මුල් දෙක ස්ට්‍රෝබෙරි ගෙඩියක් වගේ රතු වෙලා. ඇස් දෙකත් හොඳටම රතු වෙලා. කුඩම්මා ගහලා විතරක් නැවතුනේ නෑ. මේ නපුරු ගැහැනු කෙනා රෝසි වත් ඇදගෙන ගෙදරට ගොඩක් ඈතින් තියෙන කැලෑවකට ගියා, පලතුරු කඩන්න කියලා. ටිකෙන් ටික ටිකෙන් ටික කැලෑව

ඇතුලටම ගියා. ගොඩක් වෙලා පලතුරු හොය හොයා කැඩුවා. රෝසිට නම් දැන් හරිම මහන්සියි. කුඩම්මා මේක දැක්කා. කුඩම්ම රෙදි කෑල්ලක් තමාගේ ගවුමෙන් ඉරලා අරගෙන රෝසිගේ ඇස් දෙක රෙදි කෑල්ලෙන් බැන්දා. ඊට පස්සේ කිව්වා "රෝසි, දැන් ඔයා මාව අල්ලන්න." රෝසිට හරිම සතුටුයි.



රෝසි දැන් ඔයා මාව අල්ලන්න

එයාලා ටික වේලාවක් සෙල්ලම් කළා. කුඩම්මාට නම් තවමත් තිබුණේ, රෝසි ගැන තරහක් විතරමයි. "රෝසි, ඔයා ඒ කරපු වැඩේට හොඳම දඬුවම මේ තමයි". කුඩම්ම තරහෙන් පුපුර පුපුර තනියම හිතුවා. ඉතින් ඊට පස්සේ මේ නපුරු කුඩම්මා, පුංචි රෝසිව කැලෑවේ තනියම දාලා යන්න ගියා.

රෝසිට මේක තේරුනේ නෑ, එයාගේ ඇස් දෙක බැඳලා තිබුණ නිසා. ඒත් ටික වෙලාවකින් එයාට හිතුණා, කුඩම්මා සෙල්ලම් කරන්නේ නෑ කියලා. මොකද කුඩම්මාගේ පුංචි සද්දක්වත් නැති නිසා. පුංචි රෝසි හෙමිහිට එයාගේ ඇස් දෙක බැඳලා තිබුණු රෙදි කෑල්ල අයින් කළා. ඊට පස්සේ, එයා දැක්කා කුඩම්මා ජේන හරියකවත් නැති බව. එයා ගොඩක් බය වුණා. ඉකි ගගහා හයියෙන් අඬන්න පටන් ගත්තා. මේ වෙලාවේ තමයි රෝසිට "කීස්... ක්‍රීස්..." හඬ ඇහුණේ. මේ හඬ ඇහුණු නිසා රෝසි අඬන එක නතර කරා. එයා හෙමිහිට නැගිටලා ඉවර වෙලා වට පිට බලන්න ගත්තා. එක පාරටම මුළු අහසම එළිය කරගෙන අකුණක් ගැහුවා. පුංචි රෝසි අකුණු වලට හරිම බයයි. ඒ වගේම එයාට හරිම බඩගිනියි. ඉතින් රෝසි, සීතලේ වෙව්ල වෙව්ල ගෙදර යන්න පාරක් හෙව්වා. හැම පාරක්ම එක වගේ රෝසිට ආයෙත් ඇඬෙන්න පටන් ගත්තෙ එයාටත් නොදැනීමයි. "කීස්... ක්‍රීස්..." හඬ ආයෙත් රෝසිට ඇහෙන්න පටන් ගත්තේ, නොනැවතී එක දිගටමයි.



“ ක්‍රීස්... ක්‍රීස්...”

ඉතින් රෝසී ආයෙත් පාරක් වටපිට බලන්න ගත්තා. එහෙම බල බල ඉන්නකොට එකපාරටම රෝසිගේ ඇස් දෙක ලොකු වුණා. හරියට හොල්මනක් දැක්කා වගේ. හොල්මනක් දැක්කම බය හින්දනේ ඇස් දෙක ලොකු වෙන්නේ. ඒත් රෝසිගේ ඇස් දෙක හොල්මනක් දැක්කා වගේ ලොකු උනාට, එයාගේ ඇස් දෙක සතුටින් ඒ වගේම පුදුමයෙන් දිලිසුණා. රෝසි ඇස් දෙකත් ලොකු කරගෙන, කටත් සම්පූර්ණයෙන් ඇරගෙන ඒ දිහා බලාගෙන හිටියා.

පාට පාට ගිරා රැනක්, මුළු කැලෑවම යටත් කරගෙන වගේ. ඒ විතරක්ද මුළු ගිරා රැනම රෝසි ඉන්න පැත්තට පියාඹගෙන එනවා. ඒ අතරේ එක ගිරවෙක්, ඇත්තටම ඒ ගිරවියක්. හරිම ලස්සන ගිරවියක්. ඒ ගිරවියගේ මුළු ඇගම රන්වන් පාටයි. දිලිසෙනවා. හරියටම ඉර ළඟට ඇවිත් වගේ. ඇගේ හිස මත පාට පාට මැණික් ඔබ්බ වූ ලස්සන පුංචි ඔටුන්නකුත් තිබුණා. රෝසි මේ හැම දෙයක්ම දිහා පුදුමයෙන් බලාගෙන හිටියා. රෝසි වටේටම ගිරවුන්ගෙන් පිරිලා. හැම ගිරවෙක්ම රෝසි දිහා බලාගෙන ඉන්නවා කියලයි රෝසෙට හිතුණේ. ලස්සන හීනයක් දකිනවා කියලත් රෝසිට හිතුණා. ඉතින් එයා හෙමිහිට එයාගේ පුංචි අතින් කොණ්ඩය අල්ලගෙන හයියෙන් ඇද්දා. ඒ ඇදපු පාරට ඇයට මහා හඬින් කෑ ගැහුණා. ඒ විතරක් නෙවේ, ඇගේ ඇස් දෙකෙන් කඳුළුත් ආවා.

"රෝසි.. රෝසි.. මගේ පුංචි දරුවෝ", රෝසි වටපිට බැලුවා. රෝසිට විශ්වාසයි ඒ හඬ ඇහුනේ මේ ළඟකින්මයි කියලා. ඉතින් එයා වටපිට බැලුවා නොනවත්වාම. ඒත් ඉතින් එයාට මනුස්සයෙක් නම් දකින්නට ලැබුණේ නෑ. ටික වෙලාවකට පස්සේ රෝසිට තේරුණා රන්වන් ගිරවිය යයි, තමාට කතා කළේ කියලා. රන්වන් ගිරවිය ආයෙත් රෝසි ගේ ළඟටම ඇවිත් කතා කළා. ඉතින් රෝසි බයෙන් ඒ වගේම පුදුමයෙන් පිටිපස්සට අඩියක් තිබ්බා. "රෝසි බයවෙන්න එපා දරුවෝ. මම ඔයාට කිසිම කරදරයක් කරන්නේ නෑ. අපි කවුරුත්ව ඔයාට කරදර කරන්නේ නෑ." රන්වන් ගිරවිය කිව්වා.



"රෝසි, බයවෙන්න එපා දරුවෝ.
මම ඔයාට කරදරයක් කරන්නේ නෑ."

රෝසිට මේක හිතාගන්න බැරි වුණා. ඇයට තාමත් මේක හීනයක් වගෙයි. ඒත් එයාට ලොකු සතුටක් දැනුණා. මොකද එයා මෙච්චර වෙලා තනියමනෙ කැලේ හිටියේ. "ඔයා මගේ නම දන්නේ කොහොමද?" රෝසී පුදුමයෙන් ඇහුවා. "රෝසි, ඔයා මේක විශ්වාස කරන එකක් නෑ, ඒත් මේක මං ඔයාට කියන්නම ඕන." රන්වන් ගිරවිය කිව්වා."ඒ... ඒ... ත්... ත්... ඔයා කොහොමද මාව අඳුරන්නේ? මට ඒක කියන්න පුළුවන්ද?" රෝසී එක දිගටම හැමදේම කියාගෙන කියාගෙන ගියා. එයාට ගිරවියගෙන් අහන්න ප්‍රශ්න වැලක් තිබුණා. කොහොම වෙතත් මේ වෙනකොට රෝසිගේ ඇස් දෙක සතුටින් පිරිලා ඉතිරිලා ගිහින්. මොකද, එයාට මේ වෙනකන් කතා කරලා සතුටු වෙන්නවත් යාලුවෙක් හිටියේ නෑ. පැටී හොඳ යාළුවෙක් වුණත් කුඩම්මා හැමදාමත් පැටී සමග සෙල්ලම් කරනකොට රෝසීට ගහලා එයාව එක්කගෙන යනවා.

ඉතින් මේ වෙලාවේ නම් රෝසිට, පුංචි බලාපොරොත්තුවක් ඇති වුණා. ඒ තමයි එයාට හොද යාළුවෙක් හම්බවෙන්න යන්නෙ කියලා. යාළුවෙක් නෙමේ යාළුවෝ ගොඩක්. ඉතින් රෝසි, රන්වන් ගිරවිය කියන්න යන්නේ මොකද්ද කියලා නිශ්ශබ්දව හොඳට අහගෙන හිටියා. "රෝසි, මේ අහන්න ඔයාගේ අම්මා....." ගිරවිය කතාව කියන්න පටන් ගත්තා. අම්මා කියන වචනය ඇහෙද්දිම රෝසිගේ ඇස් සතුටින් දිලිසුණා. මොකද රෝසි දන්නේ නෑ, එයාගේ අම්මා

මැරිලා කියලා. "අම්මා! ඔයා මගේ අම්මා ගැන දන්නවද ?" සතුටක් සමග මහත් පුදුමයකින් රෝසි ඇහුවා. "මගේ අම්මා ඔයා එක්ක ද ඉන්නේ?අනේ එයාට මං ළඟට එන්න කියන්නකෝ. මට එයා නැතුව පාළුයි. අනේ! මගේ අම්මට මං ළගට එන්න කියන්නකෝ". රෝසි එක හුස්මට කියාගෙන කියාගෙන ගියා. රන්වන් ගිරවියට මේක අහල ගොඩක් දුක හිතුණා. "රෝසි ඔයාගේ අම්මා, ඔයා ළඟට ගේන්න මට බෑ. මොකද දැන් එයා සුරංගනා ලෝකයේ සුරංගනාවක් වෙලා ඇති. ඒත් ඔයාට එයාව පේන්නේ නැති උනාට ඔයාගේ අම්මා ඔයා දිහා හැමදාමත් බලන් ඉන්නවා. ඒක නිසා දැන් අඩන්න එපා මගේ දරුවෝ." රන්වන් ගිරවිය මෙහෙම කියලා රෝසිව සනසවන්න පටන් ගත්තා.

ඒක අහපු රෝසිට දැනුනේ එයා මේ ලෝකයෙන්ම තනිවෙලා වගේ. එයා ළඟ කවුරුත් නෑ වගේ. එයා දුකින් බිම බලා ගද්දී ඇගේ කම්මුල් දිගේ කඳුළු බිංදු රූරා ගියා. රන්වන් ගිරවිය මේ දිහා දුකෙන් බලාගෙන හිටියා. "මගේ දරුවෝ දැන් අඩන එක නවත්තන්න. මට ඔයා වෙනුවෙන් එක දෙයක් කරන්න පුළුවන්. ඒ තමයි ඔයාගේ නපුරු කුඩම්මාගෙන් ඔයාව බේරාගෙන හැමදාමත් ඔයාව සතුටින් තියන්න පුළුවන්." ගිරිවිය කිව්වා. මේක අහපු රෝසිගේ මුහුණට එළියක් වැටුනා. ඒත් එක පාරටම එයාගේ මූණ අඳුරු වුණා. "ඔයා මගේ හැම දෙයක්ම දන්නවා ඔයා කවුද? ඇයි මට මෙහෙම උදව් කරන්නේ. ඔයා දිව්‍ය ලෝකයෙන් ආපු

කෙනෙක්ද?" රෝසී බිම බලාගෙන ඇහුවා. ගිරවිය මේක අහලා හිනා වෙන්න පටන් ගත්තා. "දරුවෝ මම දිව්‍යලෝකයෙන් ආව කෙනෙක් නෙමේ. රෝසී මං ඔයාව දන්නේ ඔයා ඉපදුන්නත් කලින්. මොකද ඔයාගේ අම්මා ළඟ මං ගොඩාක් කාලයක් සතුටින් ජීවත් වුණා." "ඒත් ඔයා කොහොමද මගේ අම්මාව දන්නේ" රෝසී ඇහුවා.

"රෝසි ඉවසන්න පොඩ්ඩක්, හදිසි වෙන්න එපා. මං ඔයාට හැමදේම කියන්නම්" ගිරවිය කිව්වා. "ගොඩක් කාලෙකට කලින් ඔයාගේ අම්මයි තාත්තයි මේ කැලෑවට ඇවිත් තිබුණා. ආවේ මොකටද කියලා නම් මම දන්නෙ නෑ. මාත් ඔයා වගේම හරිම පුංචි. දවසක් මගේ අම්මයි තාත්තයි කෑම හොයන්න කියලා ගියා. මම කූඩුවේ හිටියේ තනියම මට කූඩුවේ ඉඳලා ඇතිවෙලා තිබුණේ. ඉතින් මට කූඩුවෙන් බිමට බහින්න හිතුනා. ඒත් මට ඒ වෙනකොට පියාඹන්න බෑ. මට ඒක ඒ වෙලාවේ අමතක උණා. ඉතින් මම කූඩුවෙන් බිමට පැන්නා. මගේ ගෙදර තිබුණේ ටිකක් උස ගසක ඉතින් පියාඹන්නත් බැරි මම කෙලින්ම බිමට වැටුණා. මගේ ඔලුව හයියෙන් බිම වැදුනා වගේ මට මතකයි. ඊට පස්සේ මට සිහිය නැති වෙන්න ඇති. මොකද මම ඇස් අරිනකොට හිටියේ ලී වලින් හදපු ලොකු ගෙදරක. මම ගොඩක් බය වෙලයි හිටියේ. මගේ දෙමව්පියෝ මේ ලොකු ගෙවල් මිනිස්සු ගැන ගොඩක් දේවල් කියලා දුන්නා. මගේ අම්මයි තාත්තයි හැමදාම කිව්වෙ මිනිස්සු

කියන්නේ නපුරු සත්තු වර්ගයක් කියලා. ඒත් මට ඒ ගෙදර හිටපු මිනිස්සු දැක්කම තේරුනා, හැම මනුස්සයෙක්ම නැපුරු නෑ කියලා. මොකද ඔයාගේ අම්මයි තාත්තයි මට සැලකුවේ එයාලගම ළමයෙක්ට වගේ.



“.... මොකද ඔයාගේ අම්මයි , තාත්තයි
මට සැලකුවේ එයාලගේම ළමයෙක්ට වගේ....”

"එයාලා මගේ ජීවිතේ බේරුවා. එදායින් පස්සේ මම හිටියේ ඔයාලගේ ගෙදර රෝසිට හරිම සතුටුයි. එයා ඇස් පිල්ලමක්වත් ගහන්නේ නැතුව කතාව අහගෙන හිටියා. එයාලා යන හැම තැනකම වගේ මාව එක්කගෙන ගියා. කෑම කැව්වා. අපි හැමෝම හිටියේ සතුටින් එක පවුලක් වගේ. මං හිතන්නේ ඔයාට මගේ මේ කතාව අහලා එපාවෙලා වගේ කියලා." ගිරවිය කිව්වා. "නෑ.. නෑ.. එහෙම නෑ. මං ආසයි මගේ අම්මගේ තාත්තගේ කතා අහන්න. ඒත් මට කවුරුත් ඒවා කියන්නේ නෑ. මං දවසක් තාත්තගෙන් ඒ ගැන ඇහුවම එයා මට හොඳටම බැන්නා. එහෙම බැන්නේ ඇයි කියලා මං දන්නේ නෑ ඒක නෙවෙයි. ඔයා කොහොමද දන්නේ මගේ අම්මයි තාත්තයි කැලෑවට ආවා කියලා." රෝසි ඇහුවා. "ෂා! ෂා! ඔයා මගේ කතාවට හොඳින් ඇහුම් කන් දීලානේ. ඔයා පුංචි වුනත් හරිම නුවණක්කාරයි. මට තුවාල වෙලා ඉද්දී කවුදෝ ගෑනු කෙනෙක් ආවා බෙහෙත් දාන්න. ඒ ගෑනු කෙනා ඇහුවා මාව හම්බුනේ කොහොමද කියලා. එතකොටයි ඔයාගේ අම්මයි තාත්තයි කිව්වේ මේ කැලෑවේ ගසක් යට වැටිලා ඉද්දි මාව හම්බවුනා කියලා. ඒකයි මම කිව්වේ ඔයාගේ දෙමව්පියෝ මේ කැලෑවට ඇවිත් තිබුණා කියලා." ගිරවිය කිව්වා."ඉතින් ඊළඟට මොකද උනේ?" රෝසි ඇහුවේ ඇස් දෙක ලොකු කරගෙන මහත් කුතුහලයකින්. "හ්ම්.. හ්ම්.. " "අපි එහෙම සතුටින් ඉන්නකොට තමයි ඔයා ආවේ. එක දවසක රෑ ඔයාගේ තාත්තා අම්මත් එක්කගෙන ගමේ

වෛද්‍යවරයා ළඟට ගියා ඔයාව ගේන්න. මං ඒ වෙනකොට ටිකක් ලොකුයි. ඒ වගේම මට පියාඹන්නත් පුළුවන්. ඉතින් මාත් ආවා ඔයාව බලන්න ගොඩක් සතුටින්. ඒත් මං එනකොට......" ගිරවිය අඬන්න පටන් ගත්තා. රෝසිගේ මූණ ඇඹුල් උනා. ඇය මුකුත් කීවේ නෑ. නිශ්ශබ්දව හිටියා. "මං එනකොට ඔයා ලස්සන පුංචි ඇඳක් උඩ හිටියා.



“මං එනකොට ඔයා ලස්සන
පුංචි ඇඳක් උඩ හිටියා....”

ඒ..ත්..ත්.. ඔයාගේ අම්මා ඒ වෙනකොට දිව්‍ය ලෝකෙට ගිහින්. ඔයාගේ තාත්තා පිස්සුවෙන් වගේ කෑ ගැහුවා. එයාට මාව මතක තිබුණේ නෑ. අපේ පවුල නැතිවුණා රෝසි. කොහොම හරි අන්තිමට ඔයාට නපුරු කුඩම්මා කෙනෙක් ලැබුණා." ගිරවිය දුකින් රෝසී දිහා බලාගෙන කීවා. රෝසි හයියෙන් ඉකි ගගහා අඬන්න පටන් ගත්තා. ගිරවිය මේ දිහා දුකින් බලාගෙන හිටියා. "මට බැහැ. කුඩම්මා ළඟ ඉන්න මට බැහැ." රෝසී මහ හඬින් කෑ ගහලා කිව්වේ මුලු කැලෑවටම ඇහෙන්න තරම් ශබ්දයකිනි

. "ඉතින් ඔයා ආයේ කුඩම්මා ළඟට යන්න ඕනි නෑ. ඔයා අපිත් එක්ක යමු, අපේ ගෙදරට." ගිරවිය සතුටින් කිව්වා. රෝසිට හරිම සතුටුයි. ඒ වගේ සතුටක් එයාගේ මුළු ජීවිතේටම දැනිලා නෑ. එයා උඩ පැනලා වටේට කැරකුණා. ලස්සන සින්දුවකුත් කිව්වා. ආයෙත් කැරකි කැරකී නටන්න පටන් ගත්තා. නටලා නටලා මහන්සි දැනුන හින්දා රෝසි බිම ඉඳගත්තා. "ඉතින් දරුවො අපි යමුද", "අද අපේ ගිරා ලොවට අමුත්තෙක් එකතු වෙනවා." ගිරවිය හැමෝටම ඇහෙන්න උස් හඬෙන් කිව්වා. ගිරා ලෝකයේ හැම ගිරවෙක්ම සතුටින් කෑ ගැහුවා. පුංචි රෝසිගේ හිතත් සතුටින් පිරිලා ඉතිරිලා ගිහින්, එයාගේ සතුට වැඩිකමට එයාගේ පවුලත් අමතක වුණා. රෝසි ගිරා යාළුවො එක්ක යන්න පිටත් වුණා.

කොළ පාටට ගස් හැමතැනම පිරිලා. ඒ විතරක්ද පාට පාට ලස්සන ගිරව් පිරිලා. හැමෝම තාලයට සිංදු කිය

කිය නට නට තමන්ගේ වැඩ කරනවා. "ඉතින් දරුවො අපේ ගිරා ලෝකයට සාදරයෙන් පිළිගන්නවා" රන්වන් ගිරවිය කිව්වා. රෝසි සතුටින් ගිරා ලෝකයට ඇතුළු වුණා. හැම ගිරවෙක්ම "ක්‍රීස්... ක්‍රීස්..." කියලා සතුටින් කෑ ගැහුවා. කන් දෙක බීරි වෙන තරමට සද්දෙන්.



"ඉතින් දරුවෝ .අපේ ගිරා ලෝකයට සාදරයෙන් පිළිගන්නවා."

රන්වන් ගිරවියයි ගිරව් රැනයි එකතු වෙලා රෝසිට ජීවත් වෙන්න පුළුවන් තරමේ ගෙයක් ගිරා ලෝකයේ හදලා දුන්නා. ඉතින් රෝසි ගිරවුන්ට උදව් කරමින් ඒ අය සමඟ සතුටින් සාමයෙන් ජීවත් වුණා. හුඟ කාලයක් ගෙවී ගියා. රෝසි දැන් තරුණ ගැහැණු ළමයෙක්. ඒත් තවමත් එයා පුංචි රෝසි විදිහටමයි ජීවත් වුණේ. රෝසි කියන්න බැරි තරමට ලස්සනයි. එයා තරම් ලස්සන ගෑනු ළමයි කොහෙවත් හිටියේ නෑ. ඒ තරමටම එයා හරිම ලස්සනයි. වචනයෙන් විස්තර කරන්නට බැරි තරම් ඇය ලස්සනයි.

ඔහොම ටික කාලයක් ගත වුණා. රෝසිට ටික ටික එයාගේ පවුල මතක් වෙන්න පටන් ගත්තා. නපුරු කුඩම්මා, තාත්තා, පැටී, පෝලා එයාට මතක් වෙන්න පටන් ගත්තා. ඒ වගේම ඇයට ගොඩක් දුක හිතුණා, මෙච්චර කාලයක් ගිහිල්ලත් එයාව එයාගේ පවුලේ අයට අමතක වෙලාද කියලා. රෝසි මූනත් ඇඹුල් කරගෙන ගහක් යටට ගියා. ඉකි ගගහා ඇඬුවා. ඇඬුවා දිගටම ඇඬුවා. නොනවත්වාම ඇඬුවා. එක පාරටම රෝසි අඬන එක නතර කරා. එයාට හිතුණා, ගෙදර හිටියා නම් එයාට මේ විදියට නටන්න සිංදු කියන්න බැරි බව. යාළුවෙක්වත් නැති බව.

ඉතින් එයා හිටපු තැනින් නැගිටලා ලස්සන සින්දුවක් කිය කියා නැටුවා. කුරුල්ලෝ කිචි බිචි කිච්චේ රෝසිගේ සින්දුවට තාලා තියෙනවා වගේ. මෙහෙම ටික වෙලාවක් ඉන්නකොට එයාට ලොකු සද්දයක් ඇහුනා. හරියට

අශ්වයෝ ගොඩක් දුවන සද්දයක් වගේ. එයා ඒ පැත්තට හිමින් හිමින් ගියා. මෙච්චර අශ්වයෝ ගොඩක්! රෝසි හිතන ගමන්ම තවත් ඉදිරියට ගියා. ඒ වෙනකොටත් එයා ගිරා ලොවෙන් ගොඩක් ඈතට ගිහින්. ඒ වගක් නොදැන රෝසි ගහකට මුවාවෙලා කැලෑ පාර දිහා බලාගෙන හිටියා. අන්තිමට විදුලි කුණාටුවක් ඇතින් යනවා වගේ දැක්කා. ඇයට ටිකක් බයත් හිතුනා. එතකොට තමා ඇයට මතක් උනේ දන්නේම නැතුව ඇය ගිරා ලෝකයෙන් ගොඩක් ඈතට ඇවිත් කියලා. ඇයට තවත් බය හිතුනා. ඇය එතනින් දුවන්න ලෑස්ති වුණා. දුවන්න හදනකොටම ඇයට තේරුණා ආපසු යන්න පාර සොයාගන්න බැරි බව, ඇය හඬන්න පටන් ගත්තා.



ඇය අඬන්න පටන් ගත්තා.

ඔහොම ටික වෙලාවක් ඉන්නකොට ඇයට ආයෙත් කලින් වගේම ලොකු සද්දයක් ඇහෙන්න පටන් ගත්තා. ඇයට සියල්ල අමතක වී ආයෙත් අර අශ්වයන් බැලීමට ආසා හිතුණා. නැවතත් ඇය පඳුරට මුවා වී බලා සිටියා. මෙවර නම් ඇය පෙරටත් වඩා පුදුම වුනා. මොකද රෝසි කලින් දැකලා තිබුණේ රාජකීය පෙරහැරක්. ඒකෙත් අන්තිම ටික. ඒ කියන්නේ ආරක්ෂක සෙබළු ටිකයි, එයාලගේ අශ්වයෝ ටිකයි විතරයි. ඒත් දැන් දැක්ක දේ නිසා රෝසි ගොඩක් පුදුම වුණා. ඇයගේ ඇස් දෙක ලොකු වුණා.

පාට පාට ඇඳුම් ඇන්ද වූ අශ්වයෝ ඉතාම ආඩම්බරයෙන් වේගයෙන් දුවගෙන ගියා රෝසි සිටි තැනින් ඈතට. හරියට වේගයෙන් හැමූ සුළං රැල්ලක් වගේ. ඒ විතරක්ද ඒ අතර හිටපු ලස්සනම අශ්වයා උඩ ගොඩාක් කඩවසම් තරුණයෙක් හිටියා. රෝසි ඒ දිහාම බලන් හිටියේ ගොඩක් ආසාවෙන්. ඒ වගේම පුදුමයෙන්. "රෝසි රෝසි දරුවෝ ඔයා කොහෙද?" රන්වන් ගිරවිය කතා කළා. ඒත් රෝසිට ඒක ඇහුනේ නෑ. ඇය ගල් පිළිමයක් වගේ හිටගෙන ඇගේ ඉදිරියෙන් හිටපු අශ්වයා ගැන හා අර තරුණයා ගැන කල්පනා කර කර හිටියා. "රෝසි රෝසි කොහෙද ඔයා" රන්වන් ගිරවිය නැවතත් කතා කළා. ගිරවිය රෝසිට කතා කර කර හොයන විට ගිරවිය දැක්කා රෝසි ගසකට මුවාවෙලා මොකක්දෝ දිහා බලාගෙන ඉන්නවා. ඉතින් ගිරවිය ඒ පැත්තට වේගයෙන් පියාඹලා ගියා "රෝසි මොකක් දිහාද බලන්

ඉන්නේ?" ගිරව් ඇහුවා. ඒත් රෝසියට ඇහුනේ නෑ. ගිරවිය පෙරට වඩා උස් හඬින් කතා කළා. එවිට රෝසි තිගැස්සුණා. "ආ.... මේ... ඔයා මොකක් හරි කිව්වද?" රෝසී ඇහුවා. "ඔයා කොයි වෙලාවෙද මෙතනට ආවේ. මම දැන් මෙතනට ඇවිත් ගොඩක් වෙලා. ඔයා මොනවා දිහාද බලන් හිටියේ. අනික ඔයා දැන් ඉන්නේ ගිරා ලෝකයෙන් ගොඩක් ඈතට වෙන්න. ඔයාට ඔයාගේ ආරක්ෂාව වැදගත් නැද්ද?" ගිරවිය ඇහුවා. "මං.... මං... මේ..." රෝසිට ගොත ගැහෙන්න පටන් ගත්තා. "හරි හරි ඕවා අමතක කරලා දාන්න. හැබැයි ආයෙ මෙච්චර දුර එන්න එපා. එන්න දැන් යමු." ගිරවිය කිව්වා. "මං ආයෙ මෙච්චර දුර එන්නේ නෑ. මං ඔයාට පොරොන්දු වෙනවා ඇත්තමයි" රෝසි කිව්වා.

ටික ටික රෑ බෝ වුණා. රෝසිට නිදිමත දැනුනා. ඉතින් රෝසි හැමෝටම සුභ රාත්‍රියක් පතා නිදාගන්නට ගියා. පසු දින උදෑසන රෝසි හැමෝටම කලින් අවදි වුනා. එයා ඊයේ වගේම අදත් අශ්වයෝ පිරිසක් පැමිණේ යයි කියා බලාපොරොත්තුවෙන් ගිරා ලොවෙන් එළියට ආවා. ඒ වගේම රෝසිට රන්වන් ගිරවියට දුන් පොරොන්දුවත් අමතක වුනා.

රෝසි ගොඩක් වෙලා ගසකට මුවාවෙලා පෙර දින වගේ බලාගෙන හිටියා. ඒත් කවුරුත්ම ආවේ නෑ. ඉතින් ඇය තවත් ඉදිරියට ඇදුණා. රෝසි ටිකෙන් ටික ටිකෙන් ටික ගස් වලට මුවා වෙවී ඉදිරියටම ගියා. "අයියෝ! මම මේ

කොහෙද ආවේ? මම ආපසු යන්නේ කොහොමද?"
රෝසි ගොඩක් බයවුණා.



“ අයියෝ ! මම මේ කොහෙද ආවේ ?...”

මුළු ඇඟම සීතල වුණා වගේ දැනුණා. රෝසි කැලෑවෙන් එලියටම ඒ වෙනකොට ඇවිල්ලයි තිබුණේ. ඇය සිටියේ නගරයක් තුළ ඇය කවදාවත් නගරයකට ඇවිත් නෑ. ඉතින් රෝසිගේ හිතේ තිබුණ බය ටිකක් අඩුවුනා. ඇයට නගරය තුලටම යන්න ආසාවක් ඇතිවුණා. ඉතින් රෝසි නගරය පුරාම ඇවිදින්න පටන් ගත්තා. නගර වැසියෝ ඇය දෙස පුදුමයෙන් බලා සිටියා. මොකද රෝසි තරම් ලස්සන කාන්තාවක් කවුරුත් දැකලා තිබුණේ නෑ. මෙහෙම නගරය පුරාම ඇවිදින රෝසි නිකමට වගේ අහස දිහා බැලුවා. එතකොටයි රෝසි දැක්කේ ගිරවිය තමන් දිහා තරහෙන් බලා සිටින බව, ඉතින් ඇය ඉක්මනින්ම ගිරවිය දෙසයට පිය නගන්නට පටන් ගත්තා. එදා නම් රෝසි ගිරවියගෙන් හොඳටම බැනුම් ඇහුවා.

රෝසි ගැන නගර වැසියෝ නොයෙක් කතන්දර කිව්වා. සමහරු කිව්වේ ඇය දිව්‍යලෝකයෙන් පැමිණි අයෙක් බවයි. තවත් සමහරු කිව්වා ඇය ඔවුන්ට වාසනාව රැගෙන ආ සුර දූතියක් බව. මේ ලස්සන කාන්තාව ගැන මුළු නගරයම කතා වෙන්න පටන් ගත්තා. අන්තිමට කොහොමහරි මේ ආරංචිය රාජමාළිගාව දක්වා පැතිර ගියා.

රාජ කුමාරයාට මේ ලස්සන කාන්තාව බැලීමට ආශාවක් ඇති වුණා. ඉතින් රාජ කුමාරයා තමාගේ මුළු සේනාවම යොදා මුළු රාජධානිය පුරාම ඇයව සොයන්න පටන් ගත්තා. ඒත් ඇයව හමුවුණේ නෑ. ඊළඟ දවසේත් ඇයව

සොයන්න වෙහෙසුණා. ඒත් ඇය හම්බුනේ නෑ. මේ විදිහට සතියක් පමණ ගතවුණා.

දවසක් රෝසිට ආපසු නගරය බැලීමට ආශාවක් ඇති වුණා. ඉතින් ඇය ගිරවියට හොරෙන් නැවතත් නගරයට ගියා. එදා රාජ කුමාරයා තමාගේ රාජධානියේ වසන වැසියන්ගේ සුව දුක් බැලීමට නගරයට පැමිණ සිටිය දවසක්. ඉතින් නොහිතපු වෙලාවක රාජ කුමාරයාට රෝසිව මුණගැහුණා. රාජ කුමාරයාට තමාගේ ඇස් දෙක රෝසිගෙන් ඉවතට ගැනීමට නොහැකි වුණා. ඇය එතරම් ලස්සනයි. ඔහු රෝසි දිහා බලන් හිටියේ ගල් පිළිමයක් වගේ. මඳ වේලාවකට පසු රාජකුමාරයා පියවි සිහියට පැමිණියා. ඊට පස්සේ රෝසි දෙසට ඇවිද ගියා. රෝසි පුදුමයෙන් බලා සිටියා. මුළු නගරයම නිශ්ශබ්දය. ඊළඟට කුමක් වේදෝ යන්න සියලු වැසියන්ගේ සිත් තුළ ඇතිවීම තිබුණා.

ඒත් ටික වෙලාවකින් එහෙන් මෙහෙන් හෙමිහිට හෙමිහිට කතා කරන හඬක් ඇහෙන්න පටන් ගත්තා. නගරයේ හිටපු හැමෝම කතා කලේ පුංචි රෝසිගේ ලස්සන ගැනයි. කඩවසම් රාජ කුමාරයා ගැනයි. "ඔබ සිටින්නේ කොහේද?" රාජකුමාරයා රෝසිගෙන් ඇහුවා.



“ඔබ සිටින්නේ කොහේද ?”

රෝසිට පුදුමයි. ඒ වගේම සතුටුයි. මොකද එයත් හිත හිත හිටියේ රජ කුමාරයාගේ කඩවසම් පෙනුම ගැනනේ. ඒත් ඇයට බියකුත් දැනුනා රාජ කුමාරයා සමග කතා කිරීමට. ඇය ගොත ගහ ගහ ඇය සිටින්නේ කැලේ බවත් ඒවගේම ඇයගේ අනෙකුත් සියලු විස්තරත් රාජකුමාරයාට කිව්වා. කුමාරයාටත් හරිම සතුටුයි. රාජකුමාරයා ඒ වෙලාවේම රෝසිට විවහා යෝජනාවක් ඉදිරිපත් කළා. රෝසිට නම් මේ වෙන කිසිම දෙයක් හිතාගන්න බැරි වුණා. ඇය ඒ තරම්ම පුදුමයට පත්වුණා. කෙසේ හෝ වචන ගලපාගෙන ඇය විවාහයට කැමති බව කුමාරයාට කිව්වා. මේ සිදුවීම දුටු නගර වැසියෝ සියලු දෙනාම ප්‍රීතියෙන් ඔල්වරසන් දුන්නා. හැමෝටම හරිම සතුටුයි. ගිරා පවුලටත් හරිම සතුටුයි.

ඉතින් ඊට පස්සේ මුළු රාජධානියම රාජකුමාරයාගේ විවාහ උත්සවයට සූදානම් වුණා. විවාහ උත්සවය දවසේ රෝසි සුරංගනාවක් වගේ ලස්සනට හිටියා. රෝසි තමාට කොච්චර නපුරුකම් කළත් කුඩම්මා, ඇගේ ළමයි හා තම පියා අමතක කළේ නෑ. ඔවුන්ටත් උත්සවයට ආරාධනා කළා. හැමෝම සතුටින් උත්සවය පැවැත් වූවා. මුළු රාජධානියම සැණකෙළි ස්වරූපයක් ගෙන තිබුණා.



විවාහ උත්සවය දවසේ රෝසි සුරංගනාවියක් වගේ
ලස්සනට හිටියා

පසු දින කුමාරයා රෝසිට කළ හිරිහැර වෙනුවෙන් කුඩම්මාට දඬුවම් දීමට නියම කළා. නමුත් රෝසිට කරුණාවන්ත හදවතක් තිබුන නිසා කුඩම්මාට දඬුවම් නොකරන ලෙස රාජ කුමාරයාගෙන් ඉල්ලා සිටියා. ඇය තමන්ට කෙසේ හිරිහැර කළත් කුඩම්මාට ගොඩක් ආදරෙයි. රාජ කුමාරයා රෝසිගේ ඉල්ලීමට බොහොම අකමැත්තෙන් එකඟ වුණා. කුඩම්මා තමන් අතින් සිදුවූ වැරදි සියල්ල තේරුම් ගත්තා. රෝසිගෙන් හා ඇයගේ පියාගෙන් සමාවත් ඉල්ලුවා. රෝසි ඇගේ පියා, කුඩම්මා, පෝලා, පැටී මාලිගාවට ගෙන්වා ගත්තා. ඇයට උපකාර කළ ගිරා පවුලත් අමතක කළේ නෑ. ඔවුන් සැම වෙනුවෙන්ම මාලිගාව උද්‍යානයේ අඩක්ම වෙන් කළා.

මේ ගෙවුණ දවස් කිහිපය රෝසිගේ ජීවිතයේ ඇය වැඩියෙන්ම සතුටු වූ දවස් බවට පත්වුණා. එදා ඉඳන් හැමෝම සමගියෙන් ජීවත් වුණා.

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනය ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි.

තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්.

**ISBN 978-624-208-792-4**